SINHALI
HIGHLIGHTS LIFE CHRIST



# ක්‍රිස්තු ජීවිතයේ ප්‍රධාන සිද්ධීන්

## 3

යේසුස්වහන්සේ-අනාගත වක්තෘ හා රජ

- මෝසෙස් හා සමාන අනාගත වක්තෘ
- යේසුස්වහන්සේගේ රාජ්‍යයේ ආඥ
- යේසුස්වහන්සේගේ ආඥ පිළිපැදීම

# මෝසෙස් හා සමාන අනාගත වක්තෘ

මෝසෙස් උතුම් අනාගතවක්තෘවරයෙක් හා නායක යෙක් වූයේය. ඔහු තම සෙනඟ වහල්කමින් පිටතට ගෙන විත් දෙවියන්වහන්සේගේ ආඥා ඔවුන්ට දුන්නේය. මෙසියස්වහන්සේ ද්දේව ප්‍රණිවිධ සෙනඟට දන්වන අනාගත වක්තෘ කෙනෙකු වන බව දෙවියන්වහන්සේ මෝසෙස්ට දැන්වූ සේක. උන්වහන්සේ පාපයේ වහල් කමින් සෙනඟව පිටතට ගෙනෙන සේක. උන්වහන්සේ ඔවුන්ගේ ජීවිත වල රජවී ඔවුන්ගේ දිවි පැවැත්මට නව ආඥාද දෙන සේක.

> "මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් නුඹ සමාන අනාගත වක්තෘ කෙනෙකු ඔවුන්ට නැඟුටුවාදී මාගේ වචන ඔහුගේ මුඛයේ තබන්නෙමි. මා ඔහුට අණකරන සියල්ල ඔහු ඔවුන්ට කියන්නේය. මාගේ නාමයෙන් ඔහු කථා කරක මාගේ වචන වලට ඇහුම්කන් නොදෙන කිසිවක් ඇද්ද මම ඔවුන්ට දඬුවම් කරන්නෙමි"
> ද්විතීය කථාව 18:18,19

දෙවියන්වහන්සේ මෝසෙස්ට දුන් ආඥාවලින් වසර ගණනක්ම සෙනඟ විනිශ්චය කරන ලදී. මෙසියස්වහන්සේ පැමිණි කළ එය වෙනස් වන බව මෝසෙස් ලිවේය. මෙසියස්වහන්සේ දන්වන්නාවූ ලෙසින් සැවොම විනිශ්චය කරනු ඇත. එබැවින් අප දේව කැමැත්ත අනුව ජීවත්විය යුත්තේ කෙසේදැයි දැන ගන්නට අවශ්‍ය වූ විට අප යේසුස් වහන්සේගේ ඉගැන්වීම් හෙවත් මෙසියස්වහන්සේගේ ආඥා කියවන්නෙමු.

**ඔබේ අභ්‍යාසය සඳහා**

1. යේසුස්වහන්සේට කලින් දේව ආඥා ලැබුණේ කුමන උතුම් අනාගතවක්තෘටද?

   ..................................................

2. මෝසෙස් හා සමාන අනාගතවක්තෘ වූයේ කවිද? ..........................................

© ඉංග්‍රීසි 1970 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය.
© සිංහල 1982 ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය

# යේසුස්වහන්සේගේ රාජ්‍යයේ ආඥා

## භාග්‍යවත් වන්නේ කවරුන්ද?

යේසුස්වහන්සේ කඳුකරයේදී සිය අනුගාමිකයන්ට ජීවිතයේ මූලික කාරණා ඉගැන්වූ සේක. උන්වහන්සේගේ පණිවිඩය ''කන්ද උඩ දේශණය'' යයි අපි හඳුන්වමු. දෙවියන්වහන්සේ දෙන ප්‍රීතිය ගැන උන්වහන්සේ පැවසූ සේක.



''තම ආත්මික දිළිඳුකම
වටහා ගන්නෝ භාග්‍යවත්ය !
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.''
''ශෝකවන්තෝ භාග්‍යවත්ය ! දෙවියන්
වහන්සේ ඔවුන් සනසන සේක.''
''මෘදු ගුණ ඇත්තෝ භාග්‍යවත්ය ! ඔවුන්
දේව පොරොන්දුව ලබන්නෝය.''
''දේව කැමැත්තට තද ආශා ඇත්තෝ
භාග්‍යවත්ය ! දෙවියන්වහන්සේ ඔවුන්ව
මුළුමනින්ම තෘප්තිමත් කරන සේක.''
''අන්‍යයන්ට දයාවන්තෝ භාග්‍යවත්ය!
දෙවියන්වහන්සේ ඔවුන්ට දයාවන සේක.''
''පවිත්‍ර සිත් ඇත්තෝ භාග්‍යවත්ය !
ඔවුහු දෙවියන්වහන්සේ දකින්නෝය.''
''සෙනඟ අතරෙහි සමාදාන කරන්නෝ
භාග්‍යවත්ය ! ඔවුන් දේව දරුවන්යයි
කියනු ලබන්නේය.''
''පීඩා වින්ද තැනැත්තෝ භාග්‍යවත්ය !
මක්නිසාද ඔවුන් දේව කැමැත්ත ඉටු කරන්නෝය.
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය.''
''නුඹලා මාගේ අනුගාමිකයන් නිසා මිනිසුන් නුඹලාට නින්දා පීඩා කොට නුඹලාට විරුද්ධව සියළු අගුණ බොරුවෙන් කියන කළ නුඹලා භාග්‍යවත්ය.
ප්‍රීතිවෙයල්ලා සතුටු වෙයල්ලා මක්නිසාද ස්වර්ගයේ නුඹලාගේ විපාකය මහත්ය. නුඹලාට පළමුවෙන් සිටි අනාගතවක්තෘවරුන්ටත් මිනිසුන් කළේ එයමය.''
මතෙව් 5:3–12

## රාජ්‍යයේ වැසියන් කෙබඳු අයද?

දෙවියන්වහන්සේ මෝසෙස් මගින් කළ යුතු හා නොකළ යුතු දේ ගැන මූලික ප්‍රතිපත්ති දුන්වූසේක. ඒවා වෙනස් වී නැත. නමුත් යේසුස්වහන්සේගේ ආඥා මෝසෙස්ගේ ආඥාවලට වඩා උසස්ය. මෝසෙස් සෙනඟට කළ යුතු දේ ගැන ඉගැන්වීය. යේසුස්වහන්සේ සිටිය යුතු අන්දම අපට උගන්වන සේක. අපි ජීවිතය රස ගන්වන ලුණු මෙන් හා සෙනඟට දෙවියන්වහන්සේ වෙත මාර්ගය පෙන්වන ආලෝකය මෙන් විය යුතු වෙමු.

''ඔබ මුළු මිනිස් වර්ගයාට ලුනු වැනිය......
''ඔබ මුළු ලොවට ආලෝකය වැනිය...... මනුෂ්‍යයින් ඔබගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයේ සිටින ඔබගේ පියාණන් වහන්සේට ගෞරව කරන පිණිස ඔබේ එළිය ඔවුන් ඉදිරියේ බැබලවිය යුතුය''
මතෙව් 5;13–16

### ඔබේ අභ්‍යාසය සඳහා

3. පුද්ගලයෙකුගේ ක්‍රියාවන්ට වඩාත්ම අදාලව ඇත්තේ කාගේ ආඥාද?......................
4. පුද්ගලයෙකුගේ පැවැත්මට අදාලව ඇත්තේ කාගේ ආඥාද?..................................
5. අප.........වැනි බවත්, ලොවට.................. වැනි බවත් යේසුස්වහන්සේ පැවසූ සේක.

## සිතිවිලි හා හැඟීම් පිළිබඳ ආඥා




මෝසෙස්ගේ ආඥා මිනිසුන්ට මිනිසෙකුගේ ක්‍රියාවන් ගැන විනිශ්චය කළ හැකි ඒවාය. සෑම පුද්ගලයෙකුට තම ස්වභාවය ගැන විනිශ්චය කර ගැනීමේ ආඥා යේසුස්වහන්සේ දුන් සේක. යමෙකු ආඥා කඩ නොකිරීමට මහත්සේ සැලකිලිමත් විය හැකි වුවද ඇතුලතින් පවින් පිරී සිටී. පාපී සිතිවිලි හැඟීම් හා ආශාවන් පාපී ක්‍රියාවන්ට හේතුවෙයි. පවිත්‍ර, ජීවිතයක් ගත කරනු හැකිවනු පිණිස ඇතුලාන්තය පවිත්‍රකර ගැනුමට යේසුස්වහන්සේ පැවසූ සේක.

''මෝසෙස්ගේ ආඥා හෝ අනාගතවක්තෘන්ගේ ඉගැන්වීම් අවලංගු කරනු පිණිස මා පැමිණියේ යයි නොසිතන්න. ඒවා අවලංගු කරන පිණිස නොව ඒවාට: සැබෑ අර්ථයක් දෙන පිණිස පැමිණියෙමි.''
මතෙව් 5:17

''මිනී නොමරවයි පැරැන්නෝ කී බව අසා තිබේ. නමුත් දැන් මම ඔබට කියමි. තම සහෝදරයාට නොවටිනා මෝඩයා කියන කවරෙකු නමුත් ගිනිවිලට යාමේ අවදානමෙහි සිටී.'' මතෙව් 5:21-22

''කාමමිථ්‍යාචාරය නොකරව කී බව ඔබ අසා තිබේ. නමුත් මම කියමි. ස්ත්‍රියක දෙස රාගයෙන් බලන කවරෙක් නමුත් එවලේම ඈ සමඟ සිතින් වරදෙහි බැඳුනේය.'' මතෙව් 5:27, 28

### ඔබේ අභ්‍යාසය සඳහා

6. අපේ හැඟීම් සහ සිතිවිලි සම්බන්ධව වගකීම් දෙවියන්වහන්සේ අපටම පවරන සේක්ද?

... (අ) නැත. තමාට ඇති වෙන්නාවූ හැඟීම් සහ සිතිවිලි මැඩ පවත්වා ගැනීමට කිසිවෙකුට බැරිය.

... (ආ) එසේය. අපේ සිතිවිලි හා හැඟීම් අපේ ක්‍රියාවලට මුල්වේ.

## ප්‍රේමය පිළිබඳ ආඥාව

යේසුස්වහන්සේගේ රාජ්‍යයේ ප්‍රධාන ආඥාව නම් ප්‍රේමය පිළිබඳ ආඥාවයි. දෙවියන්වහන්සේට සහ එකිනෙකාට තිබෙන ප්‍රේමයය.

ව්‍යවස්ථාව උගන්වන්නෙක් ව්‍යවස්ථාවෙහි ඉතා උතුම් ආඥාව කොයි එකදැයි ඇසුවේය. යේසුස්වහන්සේ උත්තර දෙමින් ''ඔබේ මුළු හෘදයෙන්ද මුළු ආත්මයෙන්ද, මුළු බුද්ධියෙන්ද දෙවිවූ ස්වාමීන් වහන්සේට ප්‍රේම කරනු. මෙය උතුම්වූ පළමු ආඥාවය. මෙය හා සමාන දෙවන එකක් තිබේ. ඔබේ එනම් ඔබට මෙන් අසල් වැසියාට ප්‍රේම කරනු යනුයි. මෙ ආඥා දෙක පිට මුළු ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් පිහිටා තිබේ'' යයි කී සේක. මතෙව් 22: 35–40




''ඔබේ අසල්වැසියාට ප්‍රේම කරනු. සතුරාට වෛර කරනු යි කී බව ඔබ අසා තිබේ. නමුත් මම ඔබට කියමි. ඔබගේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. මෙසේ ඔබ ස්වර්ගයෙහි සිටින ඔබගේ පියාණන්වහන්සේගේ පුත්‍රයෝ වන්නෝය. මක්නිසාද උන්වහන්සේ නපුරන්ටත්, යහපතුන්ටත් තමන් ඉර උදාකරන සේක. ධර්මිෂ්ඨයන්ටත් අධර්මිෂ්ඨයන්ටත් වැසි වස්වන සේක.'' මතෙව් 5:43-45

### ඔබේ අභ්‍යාසය සඳහා

7. එම කොටස නැවත කියවන්න.
8. උතුම්යයි යේසුස් වහන්සේ කී ආඥා දෙක කටපාඩම් කරන්න.

# යේසුස්වහන්සේගේ ආඥා පිළිපැදීම

තමන්වහන්සේගේ ආඥා පිළිපැදීම මත ඔබේ ජීවිතය රඳා පවතින බව යේසුස් වහන්සේ පවසන සේක. දැන් මෙන්ම මරණින් මතු ප්‍රීතිමත් ජීවිතයකට රහස ඒවාය.

> "මා කියන දේ නොකර ස්වාමීනි ස්වාමීනියි මට කියන්නේ මක්නිසාද? මා ළඟට ඇවිත් මාගේ වචන අසා ඒවා පිළිපදින අය කාට සමානදැයි පෙන්වමි. ඔහු ගැඹුරට හෑරූ පර්වතයක් පිට අත්තිවාරම ලා ගෙයක් සාදා ගත් මනුෂ්‍යයෙකුට සමානය. ජල ගැල්ම පැමිණ සැඩ පාර ඒ ගෙට ගැසූ නමුත් ඒක හොඳින් ගොඩනගා තිබුණු බැවින් සොලවන්නට බැරිවිය. නමුත් අසා පිළිනොපදින අය අත්තිවාරමක් නැතිව පොළව පිට ගෙයක් සාදා ගත් මනුෂ්‍යයෙකුට සමානය. සැඩ පාර ඒ ගෙට ගැසුවේය. එවෙලේම ඒක වැටුණේය. ඒ ගෙයි විනාශයද මහත් විය." ලූක් 6:46–49




යේසුස්වහන්සේගේ නීති පිළිපැදීමට උත්සාහ කිරීමේදී ඇතිවන එකම බාධාව නම් එය කිසිවෙකුට තමන් විසින්ම කළ නොහැකි වීමයි. අපේ සිත් තුල පාපය තිබේ. ආත්මාර්ථකාමය හා කැරළිකාර කම ඒ තත්වයෙන් අපව වලක්වයි. අපට කළ හැක්කේ කුමක්ද?

ආගමික නායකයෙකු වූ නිකදේමුස් සමඟ කළ සාකච්ඡාවකදී මෙම රහස යේසුස්වහන්සේ අපට පැවසූසේක. යේසුස්වහන්සේ අපට කියන දේ කිරීමට අප ආශාවන පිණිස දෙවියන්වහන්සේ අපව වෙනස් කරන සේක. උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ එසේ කිරීමට අපට උදව් කරන සේක. මෙම වෙනස් වීම නැවත ඉපදීම යනුවෙන් යේසුස්වහන්සේ හැඳින්වූ සේක. අප දෙවියන් වහන්සේගේ දරුවන් වී අළුත් ස්වභාවයකට පත් වන්නෙමු.

ලක්ෂ ගණන් ජනයා මෙම අත්දැකීම ලබා ඇත. ඔවුන් යේසුස්වහන්සේට අනුගමනය කිරීමෙන් මෙලොවදී පුදුමවූ අළුත් ජීවිතයක් ලබාගෙන තිබේ. තවද උන්වහන්සේගේ අලංකාරවූ සදාකාලිකවූ ස්වර්ගීය නිවසේ පංගුකාරයන් වීමට ඔවුහු ආශාවෙන් බලා සිටිති.

## යාච්ඤාව

දෙවියන්වහන්ස, මාගේ ජීවිතය විනාශ වෙනවාට මම අකමැති වෙමි. කරුණාකර මගේ ස්වභාවයේ ඇති නරක දේවල් ඉවත් කළ මැනව. මාව නැවත සදා ඔබගේ ප්‍රේමය මා තුළ තැන්පත් කළ මැනව. යේසුස්වහන්සේගේ ඉගැන්වීම් මත ජීවිතය ගොඩ නගා ගැනීමට උපකාර කළ මැනව. කරුණාකර මාව ඔබවහන්සේගේ දරුවකු කරගත මැනව. ආමෙන්.

## ඔබේ අභ්‍යාසය සඳහා

9. මෙම ලැයිස්තුවේ ඇති යේසුස්වහන්සේ කිරීමට යයි කී දේවල් වටකර රවුමක් අඳින්න.

දෙවියන් වහන්සේට ප්‍රේම කරන්න
විනිශ්චය කරන්න　　කමාවන්න.
කෝපවන්න　　සොරකම් කරන්න
අපරාධ කරන්න　　වෛර කරන්න
යහපත කරන්න　　මිනී මරන්න
සතුරන් උදෙසා යාච්ඤා කරන්න
එකිනෙකාට ප්‍රේම කරන්න
යේසුස්වහන්සේගේ වචනවලට කීකරුවන්න.

10. විනිශ්චය නැමති කුණාටුවේදී නොසැලී සිටින්නේත් සදාකාලෙටම පවතින්නේත් මින් කුමන ජීවිතයද?

... (අ) යේසුස්වහන්සේගේ ඉගැන්වීම් වලට කීකරුව ගොඩනැගූ එක.

... (ආ) යමෙක් තමන්ව සතුටුකිරීමට ගොඩ නැගූ එක.

... (ඇ) අන්‍යයන් සතුටුකිරීමට ගොඩ නැගූ එක.

11. ඔබ දැනටමත් නැවත ඉපදී සිටී නම් ඔබව දේව දරුවකු කරගත් නිසා දෙවියන්වහන් සේට ස්තුති කරන්න. ඔබ නැවත ඉපදී නොමැති නම් ඔබ එසේ වීමට කැමතිද?

..............................................................

එසේ නම් ඉහත සඳහන් යාච්ඤාව කියා දෙවි යන්වහන්සේ සමඟ කථා කරන්න.

## ශුභ පැතුම්

ඔබ දැන් මෙම පාඩම්මාලාවෙන් අඩක් සම්පූර්ණ කර තිබේ. මෙම පොත් පිංච ලැබුණු වහාම අපි එය ශ්‍රේණිගත කර සිව්වැනි පාඩම සමඟින් ආපසු එවන්නෙමු. සවැනි පාඩම අවසන් කළ පසු ඔබට අලංකාර සහතික පත්‍රයක් ලැබේ. ඔබ ඉගෙන ගන්නා දේ භාවිතය සඳහා දෙවියන් වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා !

## ගැටළු සහ අදහස්

.....................................................................

.....................................................................

.....................................................................

ඔබේ නම: ........................................

ලිපිනය: ........................................

දිස්ත්‍රික්කය: ........................................

වයස:.............. ස්ත්‍රී පුරුෂ භාවය:............

**අපේ ලිපිනය:**

**ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය**

**තැ. පෙ. 102**

**කොළඹ**

සිමාසහිත ඉවැන්ජල් මුද්‍රණාලය 490/8 හැව්ලොක් පාර කොළඹ 6.